**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරඟ)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ------------------
4. කලාපය : ------------------
5. පළාත : ------------------

| **6 ශ්‍රේණිය** | **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** | **කාලය පැය 02** |
|---|---|---|

I කොටසින් **එකක් ද,** II කොටසේ (අ) යටතේ **එකක් ද,** (ආ) යටතේ **එකක් ද,** (ඉ) යටතේ **එකක් ද** වශයෙන් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන **150 - 200** අතර වන සේ රචනයක් ලියන්න.
   (අ) මගේ සුරතලා
   (ආ) මා කැමතිම ලේඛකයා
   (ඇ) සුන්දර උදෑසන
   (ඈ) වැඩිහිටියන්ට සලකමු
   (ඉ) පරිසරය සුරකිමු.

(ලකුණු 40)

## II කොටස

(අ) i. ඔබගේ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී ඔබ ලබාගත් ජයග්‍රහණ පිළිබඳ දන්වමින් වෙනත් පාසලක මිතුරෙකුට ලිපියක් ලියන්න.

ii. ඔබගේ පන්ති පුස්තකාලයට අවශ්‍ය ළමා කතා පොත් කිහිපයක් ලබාදෙන ලෙස ඉල්ලමින් කොළඹ, මරදාන, 'සමාධි' පොත් සමාගමේ කළමනාකරු වෙත ලිපියක් ලියන්න.

(ලකුණු 20)

(ආ) i. 'ප්‍රියවචන කතා කරමු' යන මාතෘකාව යටතේ ඔබේ පන්තියේ ඇති බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

ii. ඔබේ පාසලේ වාර්ෂික සඟරාව සඳහා 'මා මුලින්ම පාසලට ආ දිනය' යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කරන්න.

(ලකුණු 20)

(ඉ) i. ඔබගේ පන්තිභාර ගුරුතුමිය විශ්‍රාම යන දිනයේදී පිළිගැන්වීම සඳහා සුබ පැතුම් පතක් ලියන්න.

ii. ඔබගේ උපන්දින උත්සවයට පැමිණෙන ලෙස දන්වා මිතුරෙකුට / මිතුරියකට යවන ආරාධනා පත්‍රය ලියන්න.

(ලකුණු 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
   (මුල'කුරු සමග නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ----------------------
4. කලාපය : ----------------------
5. පළාත : ----------------------

| 7 ශ්‍රේණිය | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | කාලය පැය 02 |
|---|---|---|

I කොටසින් **එකක් ද,** II කොටසේ (අ) යටතේ **එකක් ද,** (ආ) යටතේ **එකක් ද,** (ඉ) යටතේ **එකක් ද** වශයෙන් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන **150 - 200 අතර** වන සේ රචනයක් ලියන්න.
   (අ) ඉගෙනීමේ අගය
   (ආ) මගේ මාතෘ භූමිය
   (ඇ) අපෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම්
   (ඈ) පොත් කියවීමේ අගය
   (ඉ) පොදු දේපළ සුරකිමු. **(ලකුණු 40)**

## II කොටස

(අ) i. විදේශ ගතව රැකියාවක යෙදී සිටින ඔබේ පියාගේ තොරතුරු විමසමින් ලිපියක් ලියන්න.

ii. ඔබගේ පාසලේ 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 150ක් පමණ ජාතික කෞතුකාගාරය නැරඹීමට යාමට නියමිත ය. ඒ සඳහා අවසර ඉල්ලා ජාතික කෞතුකාගාරයේ අධ්‍යක්ෂතුමා වෙත යවන ලිපිය ලියන්න. පාසලේ ක්ෂේත්‍ර චාරිකා සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න. **(ලකුණු 20)**

(ආ) i. මෙවර සිංහල අලුත් අවුරුද්ද නිමිති කොට ගෙන අවුරුදු පොළක් පැවැත්වීමට පුබුදු ළමා සමාජය විසින් සියලු කටයුතු සැලසුම් කර තිබේ. ඒ පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. පුබුදු ළමා සමාජයේ ලේකම් ඔබ යැයි සිතන්න.

ii. රන්තරු ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරන ළමා ක්‍රීඩා උත්සවය ලබන මාසයේ දී පැවැත්වීමට නියමිත ය. ඊට සහභාගී වන ලෙස ආරාධනා කරමින් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය ලියන්න. ක්‍රීඩා සමාජයේ ලේකම් ඔබ යැයි සිතන්න. **(ලකුණු 20)**

(ඉ) i. 'ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය' යන මාතෘකාව යටතේ ළමා පුවත්පතකට ලියන ලිපිය සකස් කරන්න.

ii. 'සුන්දර හෝර්ටන් තැන්න' යන මාතෘකාව යටතේ ඔබේ පන්තියේ ඇති බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න. **(ලකුණු 20)**

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024
(කලාප මට්ටමේ ලිඛිත තරග)

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
(මුල්'කුරු සමග නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක්/ 500 ට වැඩි) ------------------------
4. කලාපය : ------------------------
5. පළාත : ------------------------

| 9 ශ්‍රේණිය | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | කාලය පැය 02 |
|---|---|---|

I කොටසින් **එකක් ද,** II කොටසේ (අ) යටතේ **එකක් ද,** (ආ) යටතේ **එකක් ද,** (ඉ) යටතේ **එකක් ද** වශයෙන් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන **250 - 300 අතර** වන සේ රචනයක් ලියන්න.

(අ) අපගේ ජීවිත හැඩගස්වා ගැනීමට උපදේශ සාහිත්‍ය මගින් මහත් පිටිවහලක් සැලසේ. එමගින් ජීවිතය පිළිබඳ අවබෝධය ද පුළුල් කෙරේ. ළමා අවධියේ සිටම පොත්පත් ඇසුරු කරන්නා මනා ශික්ෂණයෙන් යුතු පුරවැසියකු බවට පත්වන්නේ ඒවායේ ඇතුළත් යහගුණ ජීවිතයට ආදේශ කර ගැනීමෙනි. මේ පිළිබඳ අවධානය යොමු කර **'සරුදම් වැඩුමට පොත්පත් ඇසුරට'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ආ) අතීතයේ සිටම ක්‍රමයෙන් වර්ධනය වූ විද්‍යාව හා තාක්ෂණය මේ වන විට බෙහෙවින්ම දියුණු මට්ටමකට පත්ව ඇත. එම දැනුම් සම්භාරය ලෝකයේ යහපත් වූ වර්ධනයට මෙන්ම ලෝකයේ පරිහානියට ද භාවිත කළ අවස්ථා සඳහා උදාහරණ සුලබ ය. එහෙත් සිදු විය යුත්තේ ලෝකයේ යහ පැවැත්ම තහවුරු කරමින් මිනිසාගේ දිවි පැවැත්ම පහසු කරවීමයි. මේ පිළිබඳ අවධානය යොමු කර **'විද්‍යාව හා තාක්ෂණ දියුණුවෙන් ජීවයට හිතකර ලොවක් ගොඩ නගමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

ඇ) ශ්‍රී පාද වන්දනා ඉතිහාසය ශතවර්ෂ ගණනාවක් ඈතට දිව යයි . එතැන් සිට මේ දක්වාමත් එහි දී ව්‍යවහාර කරන වචන හා ඒ හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර ආදියෙන් යුක්ත වූ ශ්‍රී පාද වන්දනාවට ආවේණික සංස්කෘතියක් ද ඇත. ඈත හිමේ වන අරණේ සිරිපා නැමඳුමට යන ගමන මනස්කාන්ත දසුන්වලින් සුලබ ය. මේ පිළිබඳ අවධානය යොමු කර **'සිරිපා කරුණාවේ අසිරිය'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඈ) කැළි කසළ අක්‍රමවත් ලෙස බැහැර කිරීම වර්තමාන සමාජයේ ප්‍රබල ගැටලුවකි. මංමාවත්වල තැන තැන දමා යන කසළ මලු පරිසරයට හානි පමුණුවනවා පමණක් නොව විවිධ ලෙඩ රෝග ද පතුරවයි. මේ පිළිබඳ වගකිව යුතු ආයතන මෙන්ම මහජනතාව ද අවබෝධයෙන් හා වගකීමෙන් ක්‍රියා කළ යුතු ම කාලයක් මේ වන විට එළඹී ඇත. මේ පිළිබඳ අවධානය යොමු කර **'කසළ පැනයට අපෙන් විසඳුම්'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) වර්තමානයේ ජංගම දුරකථනය සමාජයට එල්ල කර ඇති බලපෑම අති මහත් ය. මෙය වරදවා භාවිත කළ ඇතැමුන් සිය ජීවිතයෙන් පවා වන්දි ගෙවූ අවස්ථා අප අසා, දැක ඇත. එහෙත් එය නිසි පරිදි භාවිතය මගින් ඉන් ලද හැකි ප්‍රයෝජන ද බොහෝ ය. මේ පිළිබඳ අවධානය යොමු කර **'පමණ දැන ජංගම දුරකථනය ඇසුරු කරමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 40)

## II කොටස

(අ) i. ඔබ මෙම වර්ෂයේ දී විද්‍යාලයේ කනිෂ්ඨ ශිෂ්‍ය නායකයකු ලෙස තේරී පත් වී ඇත. ඉදිරි සතියේ දී පැවැත්වීමට නියමිත පාසල් ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයට සහභාගී වන ලෙස ඉල්ලමින් දුර ප්‍රදේශයක සේවයේ යෙදී සිටින ඔබේ පියාට යවන ලිපිය ලියන්න.

ii. ඔබ විද්‍යාලයේ සිසුන්ගේ දෛනික පෝෂණ අවශ්‍යතාව නිසි පරිදි සම්පූර්ණ වන්නේ ද යන්න පිළිබඳ පාසල් සංවර්ධන විධායක කමිටුවේ දී සාකච්ඡා විය. ඒ අනුව ළමයින්ගේ පෝෂණ මට්ටම ඉහළ නංවා ගැනීමට සහන මිලට ලබාගත හැකි වන පරිදි කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි සලක් විද්‍යාලයේ ස්ථාපිත කිරීමට තීරණය කෙරිණි. ඒ පිළිබඳ තොරතුරු දන්වා විද්‍යාලයේ අලෙවි සලක් ස්ථාපිත කරන ලෙස ඉල්ලා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමාට යවන ලිපිය සකස් කරන්න. ඔබ විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 20)

(ආ) i. ගම්මානය මායිමෙන් ගලා යන ඔය හරහා අලුතින් පාලමක් ඉදිකිරීම හේතුවෙන් රුවන්වැල්ල ප්‍රදේශවාසීන්ට සිය ගම්මානය සඳහා නව ප්‍රවේශ මාර්ගයක් ලැබිණි. එතෙක් දුෂ්කර අඩිපාරක් ඔස්සේ බොහෝ දුරක් පා ගමනින් ගමන් කළ ඔවුන්ට එදිනෙදා කටයුතුවල දී බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු විය. මෙම සිදුවීම පදනම් කොට ගනිමින් පුවත්පත් වාර්තාවක් ලියන්න.

ii. 'සැම එක්ව ගම හදමු' යන තේමාව පෙරදැරිව වාසනාපුර ගම්වාසීන් විසින් ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීමට අපේක්ෂිත ය. එමගින් අතුරු මාර්ග එළිපෙහෙළි කිරීම හා අලුත්වැඩියා කිරීම සිදු කෙරේ. ඔබ එම ප්‍රදේශයේ සුබසාධක සංගමයේ ලේකම් යැයි සිතා ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 20)

(ඉ) i. රන්මිණිතැන්න 'දිමුතු' ළමා සමාජයේ වාර්ෂික විවිධ ප්‍රසංගයේ සමාරම්භක අවස්ථාව සඳහා සහභාගි වන ලෙස දන්වා ප්‍රදේශයේ ප්‍රාදේශීය මහ ලේකම්තුමාට යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.

ii. සාහිත්‍ය මාසය නිමිත්තෙන් ජාතික ග්‍රන්ථ ප්‍රකාශකයින්ගේ සංගමය මගින් පොත් ප්‍රදර්ශනයක් හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සැලසුම් කර ඇත. එය කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැත්වෙන අතර එහිදී පොත් මිලදීගන්නන් සඳහා සහන ද සලසා ඇත. මේ පිළිබඳව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් සකස් කරන්න.

(ලකුණු 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක්/ 500 ට වැඩි) ----------------------------
4. කලාපය : ----------------------------
5. පළාත : ----------------------------

**10 ශ්‍රේණිය** | **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** | **කාලය පැය 03**

I කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** II කොටසේ (අ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ආ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ඉ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද** වශයෙන් තෝරාගෙන ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන ව්‍යුහගත ඡේද ඇසුරින් **එකක්** තෝරා ගෙන වචන **350 - 400 අතර** වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) රජය අති විශාල මුදලක් වැය කරමින් පළමුවන ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය තෙක් පාසල් සිසු දරුදැරියන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දෙයි. පාසල් සිසුසිසුවියන් මිලියන ගණනක් සිටින අප රටේ වසර දහතුනක් පුරා සිසුවකු සඳහා වැය කරන මුදල දෙස අවධානය යොමු කළ විට මේ තත්ත්වය වඩාත් පැහැදිලි වේ. එහෙත්, සිසුන් මේ පිළිබඳ අවබෝධ කර ගනිමින් එම සම්පත් සුරක්ෂිතව පරිහරණය කරන්නේ ද යන්න හා නිසි ලෙස අධ්‍යාපනය ලබන්නේ ද යන්න ගැටලු සහගත ය. මේ පිළිබඳ අවධානය යොමු කර **'පාසල් අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා සතු වගකීම'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ආ) මෑත කාලයේ දී පරිසර උෂ්ණත්වය බෙහෙවින් ඉහළ ගොස් ඇත'යි ජන සමාජය කනස්සල්ලෙන් පසු වෙති. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් සමස්ත ලෝකයම දැඩි අවදානම් තත්ත්වයකට මුහුණ පාමින් සිටී. මෙය අප පරිසරයට සංග්‍රහ කළ ආකාරය අනුව පෙරළා පරිසරය අපට සංග්‍රහ කිරීමේ ප්‍රතිඵලයකි. මේ පිළිබඳ අවධානය යොමු කරමින් **'ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වළක්වා පරිසරය සුරකිමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඇ) සමාජයේ බොහෝ දෙනෙක් සිය ජීවන රටාව තුළ කාර්යබහුල හා ඒකාකාරී ජීවිතයක් ගත කරති. මේ හේතුවෙන් ඔවුන් මානසික වශයෙන් ඇද වැටුණු ස්වභාවයකට පත්ව ඇත. නිසි මානසික ව්‍යායාමය කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු ම කාලයකට අප එළඹ ඇත. මේ පිළිබඳ අවධානය යොමු කරමින් **'මානසික ව්‍යායාමය සඳහා සාහිත්‍ය පරිශීලනය කදිම මෙවලමකි'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඈ) ජනමාධ්‍ය මගින් ළමා මනසට සිදුකරන බලපෑම ඉතා විශාල ය. වැඩිම ප්‍රේක්ෂක ප්‍රතිචාර දිනා ගැනීමේ පොරයක පැටලී සිටින ජනමාධ්‍ය රටේ දරුපරපුර කෙරෙහි අඩු සැලකිල්ලක් දක්වන ආකාරයක් පෙනේ. ළමයා තුළ සමබර පෞරුෂයක් ගොඩනැංවීම සඳහා ජනමාධ්‍ය වෙත පැහැදිලි වගකීමක් පැවරී ඇත. මේ පිළිබඳ අවධානය යොමු කර **'දරුවන්ට හිතකර ජනමාධ්‍ය පිළිවෙතක් ගොඩ නගමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) අප රටේ සංස්කෘතියේ ප්‍රධානතම සන්ධිස්ථානය අනුරාධපුරයයි. සම්බුදු පා පහසින් මෙන්ම අනුබුදු පා පහසින් ද පාරිශුද්ධත්වයට පත්ව ඇති අනුරාධපුරය ස්වාභාවික පරිසරයෙන් ද විචිත්‍රවත් ය. ධර්ම සාහිත්‍ය ග්‍රන්ථ රාශියක් ද ජාතියට දායාද වූයේ මෙතෙක් වැඩිම කාල පරාසයක් අප රටේ අගනගරය වූ අනුරාධපුරයෙනි. මේ පිළිබඳ අවධානය යොමු කර **'මාතෘභූමියේ ශ්‍රී විභූතිය අනුරාධපුරයයි.'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 40)

## II කොටස

(අ) i. සිංහල භාෂා දිනය නිමිත්තෙන් ගඟසිරිපුර මහා විද්‍යාලයේ සිංහල සාහිත්‍ය සංගමය මඟින් විද්‍යාලාන්තර විවාද තරඟාවලියක් පැවැත්වීමට තීරණය කර ඇත. ඔබ එම සංගමයේ ලේකම් යැයි සිතා එයට අදාළ විස්තර ඇතුළත් කරමින් ඊට අවශ්‍ය මාධ්‍ය ආවරණය සලසා දෙන ලෙස ඉල්ලා ජාතික රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට යවන ලිපිය ලියන්න.

ii. සමන් එළිය 'මිණිමුතු' ළමා සමාජය මඟින් මෙවර පොසොන් සතිය පින්කම් මාලාවේ එක් අංගයක් ලෙස ප්‍රදේශයේ විහාරස්ථානයේ රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීමට තීරණය කර ඇත. ඔබ එම ළමා සමාජයේ ලේකම් යැයි සිතා ඊට අවශ්‍ය පැළ වර්ග හා ඒවා සපයා ගැනීම ද, අදාළ අනෙකුත් කරුණු ද සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ඉල්ලා **'හරිත පියස'** පැළ තවානේ කළමනාකරු වෙත යවන ලිපිය ලියන්න. (ලකුණු 20)

(ආ) i. විධිමත් පානීය ජල ව්‍යාපෘතියක් නොමැතිකම හේතුවෙන් කටුගස්තැන්න ප්‍රදේශයේ පවුල් දෙසියයක් පමණ පීඩාවට පත්ව සිටින ආකාරය පසුගියදා මාධ්‍ය මගින් අනාවරණය කරන ලදී. මේ සඳහා පිළියම් සැපයීමට වීරපුර ශ්‍රී සරණංකර ගුණානුස්මරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධානය ඉදිරිපත් විය. ඒ මගින් එම ප්‍රදේශවාසීන් සඳහා විධිමත් පිරිසිදු පානීය ජල පහසුකම් සකස්කර ජනතා අයිතියට පත් කෙරිණි. මේ පිළිබඳ අවධානය යොමු කරමින් ඔබ එම ප්‍රදේශයේ වාර්තාකරු යැයි සිතා සුදුසු පුවත්පත් වාර්තාවක් සකස් කරන්න.

ii. ජගත් පරිසර දිනය නිමිත්තෙන් පරිසර දින සැමරුම් උලෙළක් පැවැත්වීමට සඳගල, ගැමුණු මහා විද්‍යාලයේ පරිසර සංගමය කටයුතු සංවිධානය කර ඇත. පරිසරය පිළිබඳ සිසුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහන් හා ඊට අදාළ විශේෂාංග ද රැසකින් යුත් මෙම උලෙළ සඳහා පරිසරවේදීහු ද සහභාගි වෙති. ඊට සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න.

(ලකුණු 20)

(ඇ) i. වීරවිල තරුණ ගොවි සංවිධානය විසින් සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සතිපොළක් පැවැත්වීමට තීරණය කර ඇත. මෙය වීරවිල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී සෑම සතියකම නිශ්චිත එක් දිනක පැවැත්වේ. මේ පිළිබඳ ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීමක් සකස් කරන්න.

ii. ප්‍රදේශයේ ශීඝ්‍රයෙන් පැතිර යන වෛරස් උණ රෝගයෙන් ජනතාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව අතර බෙදාහැරීමට සුදුසු අත්පත්‍රිකාවක් සකසන්න. ගලේවෙල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ඔබ යැයි සිතන්න. (ලකුණු 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරඟ)**

1. අපේක්ෂකයාගේ නම : ---------------------------------------------
(මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ---------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක්/ 500 ට වැඩි) ---------------------------
4. කලාපය : ---------------------------
5. පළාත : ---------------------------

| **11 ශ්‍රේණිය** | **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** | **කාලය පැය 03** |
|---|---|---|

I කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** II කොටසේ (අ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ආ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ඉ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද** වශයෙන් තෝරාගෙන ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන ව්‍යුහගත ඡේද ඇසුරින් **එකක්** තෝරා ගෙන වචන **350 - 400 අතර** වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(I) නූතන ලෝකයේ සන්නිවේදන ජාලය මගින් මුළු ලෝකයම එකම ගම්මානයක් බවට පත් වී ඇත. භාෂණය, ලේඛනය සංඥා ආදී සන්නිවේදන මාධ්‍ය ආදිය ද ගෝලීයකරණය තොරතුරු තාක්ෂණය, අන්තර්ජාලය වැනි අංග ද සන්නිවේදනයට එක් වී ඇත. මෙම ජන සන්නිවේදනයේ අරමුණ විය යුත්තේ සමාජයට යහපත සැලසීමයි. එහි හිතකර ලක්ෂණ කෙරේ අවධානය යොමු කිරීමෙන් මානව හිතවාදී ලොවක් ඇති කළ හැකි ය.

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමට ලොව සැම රටක් ම බැඳී සිටිය ද ළමයින් මෙහෙකාර සේවයේ යෙදවීම, විවිධ අපයෝජනයට ලක් කිරීම, අමානුෂික දඬුවම්වලට ලක් කිරීම ප්‍රබල සමාජ ගැටලුවකි. විවිධ හේතු මත අසරණ දරුවන් අනාරක්ෂිත වී ඇත. මෙම ප්‍රශ්නයට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු ය.

(iii) අතීතයේ සිට අපගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. රටට බත සපයන ගොවියාගේ වර්තමාන තත්ත්වය එතරම් සතුටුදායක නොවේ. වියදමට සරිලන ආදායමක් නොලැබීම නිසා ණය බරින් අසරණ වී ඇත. ගොවියා මුහුණ දෙන සැබෑ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීම රජයේ වගකීමකි.

(iv) කොළඹ යුගයේ බිහි වූ ඇතැම් කවීන් නිසා ළමා ගීත කලාවක් ශ්‍රී ලංකාවට හිමි විය. එයින් ළමයින්ගේ විනෝදය, චින්තනය, නිර්මාණාත්මක හැකියාව පුළුල් වූ අතර පෞරුෂය ද වර්ධනය විය. ගුවන් විදුලිය මේ සඳහා පුරෝගාමී විය. වර්තමානයේ ළමා පරපුරට මෙය අහිමිවෙමින් පවතී. මේ නිසා ළමා ගීත සාහිත්‍යය කෙරේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

**(ලකුණු 40යි)**

## II කොටස

(අ) i. රුවන්පුර, සූරතිස්ස මහා විද්‍යාලයේ අ.පො.ස (උ.පෙ,) දරු දැරියන් ගන්නොරුව කෘෂිකර්ම පර්යේෂණ ආයතනය නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර ඇත. මේ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් අවසර ඉල්ලා යවන ලිපිය ලියන්න. (ඔබ එම විද්‍යාලයේ විදුහල්පති සුනිමල් ජයමාන්න යැයි සිතන්න.

ii. සමනලවැව, පැරකුම්බා මාවතේ පිහිටි ශ්‍රී ජය විදුලි භාණ්ඩ අලෙවි ආයතනයෙන් මිළ දී ගන්නා ලද රූපවාහිනි යන්ත්‍රයේ යාන්ත්‍රික දෝෂයක් පිළිබඳ ව දැනුවත් කරමින් එය අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලා වෙළඳ ආයතනයේ කළමනාකරු වෙත යැවීමට සුදුසු ලිපිය සකස් කරන්න. (ඔබ 18/B හි පදිංචි මල්පිටිය, විජිත මාවතේ සඳුන් කල්හාර යැයි සිතන්න)

**(ලකුණු 20යි)**

(ආ) i. සල්මල්ලන්ද, ශ්‍රී මහින්ද මධ්‍ය මහා විද්‍යාලයේ සෞන්දර්ය අංශය සංවිධානය කරන වාර්ෂික කලා උලෙළ විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ දී 2024.09.16 දින ප.ව 1.30 සිට 4.30 දක්වා පැවැත්වීමට සංවිධායක මණ්ඩලය තීරණය කර ඇත. මේ සඳහා සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න.

ii. රන්කැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික මහෝත්සවය. 2024.07.14 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේ දී ප්‍රවීණ කලාකරුවන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි. මෙහිදී ප්‍රවීණ ලේඛකයන් දසදෙනෙකුට ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ සඳහා සම්මාන පිරිනැමුණි. උත්සවයේ ප්‍රධාන අමුත්තා ප්‍රවීණ මාධ්‍යවේදී උපුල් දේශප්‍රිය මහතා ය. ඉහත තොරතුරු ඇසුරින් පුවත්පත් වාර්තාවක් ලියන්න. (ඔබ රන්කැටිය ප්‍රාදේශිය වාර්තාකරු තුෂාර මහවත්ත යැයි සිතන්න)

**(ලකුණු 20යි)**

(ඉ) i. ගෝනදෙණිය, යෞවන සමිතිය මගින් ගෝනදෙණිය පුරාණ විහාරස්ථානයේ දී අක්ෂි සායනයක් පැවැත්වීමට සුදානම් කර ඇත. මේ පිළිබඳව ප්‍රදේශවාසින් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාව සකස් කරන්න.

ii. ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන කිහිපයක් හා ඒවායේ වටිනාකම පිළිබඳව බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් ලියන්න. (වචන 150ක් පමණ ප්‍රමාණවත් ය.)

**(ලකුණු 20යි)**

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024

(කලාප මට්ටමේ ලිඛිත තරග)

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
(මුල්'කුරු සමග නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක්/ 500 ට වැඩි) ------------------------
4. කලාපය : ------------------------
5. පළාත : ------------------------

| 12, 13 ශ්‍රේණි | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | කාලය පැය 03 |
|---|---|---|

I කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** II කොටසේ (අ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ආ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද,** (ඉ) කොටසින් **එක් ප්‍රශ්නයක් ද** වශයෙන් තෝරාගෙන ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙක වචන 450 - 500 අතර වන සේ වාක්‍ය රචනයක් ලියන්න.

(අ) ඈත අතීතයේ පටන් අපට ඉතා පොහොසත් ළමා සාහිත්‍යයක් ඇත. එසේම වර්තමානයේ ළමයින් උදෙසා නිර්මාණය වන කියවීම් පොත්වල ප්‍රමාණාත්මක වර්ධනයක් ද දක්නට ඇත්තේ ය. එමෙන්ම අලෙවිකරණ ක්ෂේත්‍රය දෙස බැලුව ද ළමා කතන්දර පොත්වලට ඇත්තේ හොඳ ඉල්ලුමකි. දරුවන්ගේ ජීවිතයේ සැබෑ යථාර්ථය හඳුනාගෙන, එයට අර්ථවත් ලෙස මුහුණ දීමට හැකි ආකාරයට ළමා මනස ගොඩනගන ළමා සාහිත්‍යයක් රටකට අත්‍යවශ්‍ය ය. එහෙත් ළමයින්ට උචිත සාහිත්‍ය පොත්පත් අනුමත කිරීමට අදාළ ව කටයුතු කරනු ලබන ආයතන වෙත ඉදිරිපත් කරන ලද බොහොමයක් සාහිත්‍ය කෘති අදාළ නිර්ණායක මට්ටම්වලට ළඟා නොවීම නිසා ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු මතු වී තිබේ. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **'අද බිහිවන ළමා සාහිත්‍ය නිර්මාණ'** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) වර්තමානයේ රොබෝ තාක්ෂණයෙහි දියුණුවත් සමග බහුලව භාවිත වන පදයකි Artificial Intelligence හෙවත් කෘත්‍රිම බුද්ධිය. කෘත්‍රිම බුද්ධිය ඇති උපකරණයකට තමා අවට පරිසරයේ සිදුවන ක්‍රියාවන් සහ වෙනස් වීම් හඳුනාගෙන, මිනිසාගේ මැදිහත්වීමකින් තොරව ම සාමාන්‍යයෙන් මානව බුද්ධිය අවශ්‍ය වන කාර්යයන්ට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට හැකි ය. මේ වන විට මෙමගින් සෞඛ්‍ය සේවා, මූල්‍ය, ප්‍රවාහන, නිෂ්පාදන සහ විනෝදාස්වාදය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල යෙදුම් සොයාගෙන ඇත. කෙසේ වෙතත්, එය පෞද්ගලිකත්වය, පක්ෂග්‍රාහීත්වය සහ රැකියාවට ඇති බලපෑම වැනි සදාචාරාත්මක සහ සාමාජීය අවශ්‍යතා ද මතු කරයි. මිනිසා විසින් ම නිර්මාණය කළ තාක්ෂණය මිනිසාට ම එරෙහි වන දවසක් උදා වීම වැඩි ඈතක නොවේ. පරිගණකයක් තුළට කෘත්‍රිම බුද්ධියක් ලබාදීම හෝ අසීරු යැයි පවසන කලාත්මක හැකියාව ලබා දීම හෝ සිදු කළ හැකි නමුදු සදාචාර සම්පන්න ආචාරධර්ම ඉගැන්විය හැකි දැ යි ගැටලුවකි. මෙම තොරතුරු සැලකිල්ලට ගනිමින් **'කෘත්‍රිම බුද්ධියේ තාක්ෂණික බලපෑම'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) ශ්‍රී ලංකාවේ වාසය කරන අපට ස්වාභාවික සම්පත්වලින් අඩුවක් නැත. රටක ශ්‍රී විභූතිය හා සුන්දරත්වය විදහා දක්වන සාධක ලෙස ස්වාභාවික සම්පත් සැලකිය හැකි ය. ගහකොළ, සතුන්, ගංගා, දිය ඇලි, පොකුණු උද්‍යාන, අභය භූමි හා ඝන කැලෑවන් ආදිය අප සතු ස්වාභාවික සම්පත් ගණයට අයත් වේ. මේ සියල්ල ආරක්ෂා කර ගැනීම අප සතු යුතුකමකි. මෙම කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් **'අපේ ස්වාභාවික සම්පත් අපි සුරකිමු'** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඊ) ජගත් මිහිතල දින සංවිධානය විසින් මෙවර ජගත් මිහිතල දින තේමාව ලෙස ප්‍රකාශ කර ඇත්තේ 'ප්ලාස්ටික්වලට එරෙහිව මිහිකතම' යන්න යි. ඒ අනුව මෙවර ජගත් මිහිතල දිනය වෙනුවෙන් 2040 වන විට සියලුම ප්ලාස්ටික් නිෂ්පාදන 60% කින් අඩු කිරීමට අපේක්ෂිත ය. මිනිසාගේ සහ ග්‍රහලෝකවල සෞඛ්‍යය වෙනුවෙන් ප්ලාස්ටික් අවසන් කිරීමට අප සියලු දෙනා ම නොසැලී කැපවිය යුතු ය. සිසුන්, දෙමාපියන්, ව්‍යාපාරිකයන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, වෘත්තීය සමිති, විවිධ පුද්ගලයන් සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධව ප්ලාස්ටික්වලින් තොර ලෝකයක් ගොඩනැගීම සඳහා නව්‍ය තාක්ෂණය සහ ද්‍රව්‍ය ආයෝජනය කිරීමට, භාවිතයට හුරු විය යුතු ය. මෙම කරුණු ගැන සිතා **'ප්ලාස්ටික්වලින් තොර නව ලොවකට'** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(උ) වර්තමානය වන විට ලක්ෂ සංඛ්‍යාත තරුණ පිරිස් උසස් අධ්‍යාපනය හෝ රැකියාව වෙනුවෙන් විදේශගත වෙමින් සිටිති. උසස් පෙළ සමත් තරුණ පිරිසට රටේ ප්‍රමාණවත් උසස් අධ්‍යාපන පහසුකම් ඇති කරන්නට ගත වූ කාලයේ පත් වූ ඇතැම් රජයයන් යටතේ කටයුතු කළත්, විවිධ ව්‍යාපාර තම දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රවලට අනුව යමින් ඒ සියලු අවස්ථාවලට බාධා ඇති කළහ. ආර්ථික අපහසුතා ඇති තරුණ පිරිසට රජයේ ණය පහසුකම් යටතේ හෝ වෛද්‍ය අධ්‍යාපනය හැදෑරීම සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල කිහිපයක් රටේ ස්ථාපිත විය යුතු ය. සෑම පළාතක් ම නියෝජනය වන පරිදි වෛද්‍ය, ඉංජිනේරු, තාක්ෂණික, කළමනාකරණ විශ්වවිද්‍යාල ඇති කිරීමෙන් උසස් අධ්‍යාපනය සඳහා විදේශවලට ඇදී යන සිසුන්ට තම රටේදී ම ඒ සඳහා අවස්ථා උදා වනු ඇත. මෙම කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් **'උසස් අධ්‍යාපන ඉලක්ක සහ අපේ තරුණ පරපුර'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 40)

## II කොටස

(අ) i. පාසල් යන වියේ සිටින දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීම සඳහා වෛද්‍ය සායනයක් පැවැත්වීමට ප්‍රභාපුර, ප්‍රජා සංවර්ධන සමිතිය කටයුතු සූදානම් කර ඇත. ඒ සඳහා විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය රෝහලේ අධ්‍යක්ෂ වෙත යවන ලිපිය ලියන්න. ඔබ ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.

ii. කොළඹ, ග්‍රෙගරි මාවතේ පිහිටි සිංගර් අලෙවිසලෙන් ඔබ නිවසට පසුගිය වසරේ මිල දී ගෙනෙන ලද රූපවාහිනී යන්ත්‍රයේ ඇති වී තිබෙන දෝෂ කිහිපයක් පිළිබඳ ව සඳහන් කරමින්, එය අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා එම අලෙවිසලෙහි කළමනාකරු වෙත යැවෙන ලිපිය සකස් කරන්න.

(ලකුණු 20)

(ආ) i. මාලිගාතැන්න, සම්බෝධි විදුහලේ සිංහල සාහිත්‍ය සංගමය විසින් 'රන් දියවර' කලා උලෙළ ප්‍රවීණ නාට්‍ය ශිල්පියකුගේ ප්‍රධානත්වයෙන් ලබන මාසයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. සිසුන්ගේ විවිධ නර්තන, ගායන, රංගන අවස්ථාවන් ඇතුළත් මෙම උලෙළ පෙරවරු 9.00 සිට පස්වරු 1.00 දක්වා පැවැත්වීමට අපේක්ෂා කෙරේ. එම උලෙළ සඳහා න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

ii. මිල්ලගහවත්ත ග්‍රාමයේ නිවාස අහිමි, අඩු ආදායම්ලාභී පවුල් දහයකට 'සුමිතුරෝ' ප්‍රජා සත්කාර ඒකකය මගින් තනවන ලද නව නිවාස සංකීර්ණයේ යතුරු භාරදීමේ සුවිශේෂී අවස්ථාව පිළිබඳ පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. ඔබ එම ග්‍රාමයේ ප්‍රාදේශීය පුවත්පත් වාර්තාකරු කුසුම්සිරි ජයලත් යැයි සිතන්න.

(ලකුණු 20)

(ඉ) i. පාසල් සිසුන්ගේ කියවීමේ කුසලතා සංවර්ධනය කිරීමේ හා සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයට යොමු කිරීමේ අරමුණ ඇතිව නවෝදාපුර, මහජන පුස්තකාලය මගින් ආරම්භ කර ඇති කියවීම් කඳවුර පිළිබඳව ප්‍රදේශයේ පාසල්වල සිසුන් දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

ii. ඔබගේ විද්‍යාල භූමියේ භාවිතයට නොගෙන වල් බිහි වී, අපවිත්‍ර වී ඇති ස්ථාන කීපයක් යළි සකසා එළවළු හා පලතුරු වගා කර සුන්දර පරිසරයක් කිරීම සඳහා පරිසර සංගමය විසින් ශ්‍රමදානයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ඊට සහභාගී වී සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා දෙමව්පියන් වෙත යැවෙන දැන්වීම සකස් කරන්න.

(ලකුණු 20)